**මතුගම ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

**--------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 27 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු රු.6,913,110 ක මුදල සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදි ණයහිමි වෙන් කිරිම් සිදු කරමි. |
| (ii) | 2018 වර්ෂයේ මිළදී ගත් රු.1,481,265 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කරමි. |
| (iii) | 2019 වර්ෂයේදී මිලදී ගැනීමට බලාපොරොත්තු වූ රු.1,500,000 ක් වටිනා ත්‍රී රෝද රථ දෙකක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වැය හා ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | ගිණුම් වලින් ඉවත් කිරිම සිදු කල යුතුවේ. | 2018 වර්ෂයේදි මහා භාණ්ඩාගාරය වෙත අයදුම්පත් ඉදිරිපත් කල බැවින් ණයහිමි වෙන් කර ඇති අතර ඉදිරියේදී එවැනි වැරදි සිදු නොකරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාතියක් වෙනුවෙන් ගෙවන ලද රු.49,310 ක් කර්මාන්ත ණයහිමි ලෙස ගිණුම් ගතකර තිබුණි. | 2018 වර්ෂයේ ගෙවීම් කර ඇති බැවින් ණයහිමියන්ගෙන් ඉවත් කල යුතුවේ. | මෙම ව්‍යාපෘතිය සඳහා ලද මුදල 2018 දෙසැම්බර් 15 බැංකු ගත කර 2019 ජනවාරි 10 ණයහිමි යටතේ ගෙවීම් කර ඇත. |
| (v) | 2017 වර්ෂයේදි රු.979,708 ක් වැයකර ඉදිකරන ලද ජල ටැංකිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කල යුතුවේ. | 2019 දී නිවැරදි කරමි. |
| (vi) | 2019 වර්ෂයේදි නිදහස් කරන ලද රු.526,351 ක පොදු තැන්පත් ශේෂය සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු තැන්පත් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ | 2019 දී නිවැරදි කරමි. |
| (vii) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.2,261,850 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. | 2019 දී නිවැරදි කරමි. |
| (viii) | 2018 වර්ෂයට අදාල 2019 වර්ෂයේ ගෙවනලද රු217,891 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරි තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ . | 2019 නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉවත් කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලන් ඉවත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරිමට කටයුතු කල යුතුවේ | 2019 දී නිවැරදි කිරිමට කටයුතු කරනු ලැබේ. |
| (x) | රු.1,567,445 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතුවේ. | පිළිතුරු ලබා දී නැත.. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා තොග ලේඛන | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන | ඉඩම් නව තක්සේරුවක් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත |

| | | |
|---|---|---|
| නොමැතිවීම නිසා පිළිවෙලින් රු.333,151,550 හා රු.443,656 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | යවා ඇති අතර නව තක්සේරු ලැබීමෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරන බව හා තොග ලේඛන 2019 මුල්‍ය විගණනයේදී ඉදිරිපත් කරමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට පැවත එන රු.358,225 ක් වූ විථි ආලෝක ආධාර ශේෂයක් හා රු.96,000 ක් වූ පෞද්ගලික බස්නැවතුම්පල ගාස්තු ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිගු කාලීනව අයවිය යුතු මෙම ශේෂයන් අයකර ගත යුතු වේ. | විථි පහන් ආධාර අයකර ගත නොහැකි බැවින් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති අතර පෞද්ගලික බස් නැවතුම්පල ගාස්තු අයකර ගැනීම සඳහා බස් නැවතුම්පලේ අයිතිය තහවුරු කර ගැනීමට අදාල නීතිමය හා අනිකුත් ක්‍රියා මාර්ගයන් ගනිමින් සිටිමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

---------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (i) 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | පනත අනුව නව හදුනා ගැනිම් සිදු කල යුතුවේ. | දීර්ඝ ක්‍රියාවලියක් මේ සඳහා අනුගමනය කල යුතු බැවින් ඒ අනුව කටයුතු කරමි. |
| | (ii)154(1) වගන්තිය | | කට්ටිකර විකිණූ ඉඩම් අටකින් සියයට එකක බද්ද අයකර නොතිබුණි. | ඉඩමේ විකිණුම් වටිනාකමින් සියයට 1 ක බද්දක් අය කළ යුතු වේ. | ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම් නොකරන නිසා හා ඉඩම්වල අයිතිය තනි පුද්ගලයෙකු සතුව ඇති |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | නිසා බදු අය කර ගත නොහැකිය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 326,760 | තත්කාර්ය අත්තිකාරම් පියවා නොතිබුණි. | අදාල කාර්යය නිම වූ විගස අත්තිකාරම් පියවිය යුතුවේ. | 2018 වර්ෂයට පෙර සියළු අත්තිකාරම් පියවා ඇති අතර 2018 අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් සිදු වූ බව පිළිගෙන ඇත. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 1,736,704 | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | ඉදිරි වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 | - | සභා සතු වාහන 07 ක ඉන්ධන දැවීම පරික්ෂා කර නොතිබුණි. | සභාව සතු සියළු වාහනවල ඉන්ධන දැවීම පරික්ෂා කල යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දැවීම පරික්ෂා කරමි. |
| (ඇ) | 2004 ජුලි 09 දිනැති අංක LG/05/2004 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 ඡේදය | - | ඇප ලබාගත යුතු නිලධාරීනියකගෙන් රක්ෂණ ඇප ලබාගෙන නොතිබුණි. | ප්‍රමාණවත් ඇප මුදලක් අය කිරිම හෝ ඇප රක්ෂණය සිදු කල යුතුවේ. | 2018 දී ඇප රක්ෂණය සඳහා මුදල් ගෙවා නැති අතර 2019 දී එය යාවත්කාලින කරමි. |

2, මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,020,020 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,752,763 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,776,500 | 14,554,045 | 12,180,632 | 2,373,413 | 15,123,000 | 14,281,441 | 12,572,291 | 1,709,150 |
| (ii) | කුලි | 8,944,800 | 10,076,431 | 9,520,911 | 555,520 | 5,785,300 | 8,537,997 | 8,202,507 | 335,490 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 332,000 | 468,628 | 468,628 | - | 400,000 | 392,500 | 372,250 | 20,250 |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් හිඟය රු.4,461,546 ක් විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් රැස් කිරිමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) සභාවේ වරිපනම් බදු හිඟයෙන් වසර 05 කට වඩා පැරණි හිඟ රු.483,361 ක් ද, වසර 03 -05 අතර හිඟ රු.93,306 ක්ද, වසර 01-03 ත් අතර හිඟ රු.869,217 ක් ද වසරකට වඩා අඩු හිඟ රු.2,249,851 ක් ද විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් රැස් කිරිමට කටයුතු කරමි. |

2.2.3 කුලී ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 මැයි 31 දිනට වෙළඳ ස්ථාන කුලී හිඟය රු.189,525 ක් විය. | හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් රැස් කිරිමට කටයුතු කරමි. |

2.2.4 ව්‍යාපාර බදු

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට ව්‍යාපාර බදු හිඟය රු.106,720 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.55,120 ක් හෙවත් සියයට 52 ක් පමණක් අයකර ගෙන තිබුණි. | හිඟ ආදායම කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් රැස් කිරිමට කටයුතු කරමි. |

2.2.5 මුද්දර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂය අවසානයේ ලැබිය යුතු මුද්දර ගාස්තු මුදල රු.41,010,456 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2018 වර්ෂයට අදාලව උපලේඛන සකස් කරමින් පවතී. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>------------------<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කල හැකි කාරණා 08 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මට අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති 09 ක් විය. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කලයුතු වේ. | ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වියදම වැඩිවීම රු.8,824,847 ක් හෙවත් සියයට 60 ක් විය. වාර්ෂිකව ඉහළ යන කසළ වියදම පියවා ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගැනීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | වියදම අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. | කසල බදු අය කිරිම තුලින් වියදම් අවම කර ගැනිමට කටයුතු කරමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරිම සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඒ සඳහා නිලධාරියෙකුද යොදවා ඇතත්, මේ සම්බන්ධව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බැවින් ඉහත කී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ගැටළුකාරී තත්ත්වයක් උද්ගතව තිබුණි. | තිරසර සංවර්ධන සැලැස්ම කඩිනමින් ක්‍රියාත්මක කල යුතු වේ. | 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තනතුරු 10 ක පුරප්පාඩු 12 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලයට අතිරේකව ආදේශක පදනමින් 06 ක් , තාවකාලික පදනමින් 16 ක් හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2014 ප්‍රකාරව තනතුරු 06 කට අදාලව නිලධාරින් 42 ක්ද බඳවාගෙන තිබුණි. එකී නිලධාරින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරවා ගැනිම හා පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කරන ලෙස ඉල්ලීම් කර ඇත. |

| | | |
|---|---|---|
| ගැනීමට 2019 මැයි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) සභාව සතුව වාහන 23 ක් තිබෙන නමුත් ස්ථිර රියදුරන් සිටිනුයේ 09 ක් පමණි. | රියදුරු පුරප්පාඩු පිරවිය යුතුවේ. | ව්‍යාපෘති පදනම මත රියදුරන් බඳවා ගැනිමට අනුමැතිය ඉල්ලා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇත. |

3.3 වත්කම් කළමණාකරණය
--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුසාන භූමි 23 ක අයිතිය 2019 මැයි 31 දින වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | සුසාන භූමි 23 ක අයිතිය සභාව වෙත පවරා ගත යුතුවේ. | සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශිය ලේකම් වෙත ලිපි යොමු කර ඇත. |

4. නොවිසඳී ඇති නිරීක්‍ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්
------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 සැප්තැම්බර් 27 දින පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 2.5(ඇ) , 2.6 (ආ) හා 2012 විගණකාධිපති වාර්තාවේ 2.2 (ඇ) ඡේද සම්බන්ධයෙන් දි තිබු නියෝග 2019 මැයි 31 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කල යුතුවේ. | 2019 පෙබරවාරි 22 දිනැති ලිපිය මගින් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇති අතර ඊට මාස 02 ක කාලයක් ගිණුම් කාරත සභාව ලබා දී ඇත. |
| (ආ) 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1( එ) හා (ඒ) ඡේද නිවැරදි කර නොතිබුණි. | පෙර වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කල යුතුවේ. | 2018 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි මහහැරී ඇති බැවින් 2019 වර්ෂයේදී නිවැරදි කරමි. |